# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය
# කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
# ව්‍යාපෘති කාර්ය මණ්ඩල පුරප්පාඩු

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ දුම්රිය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මකවූ අතර දුම්රිය සංවර්ධනය උදෙසා සිදු කරන ඉතා විශාල ව්‍යාපෘතියක් ලෙස විද්‍යුත් කරණය ඇතුලත්ව දුම්රිය සංවර්ධනයද එක් කරමින් ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කර ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක වේ. මෙම කටයුතු සිදු කිරීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇති අතර එම කටයුතු මෙම අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරනු ලබයි.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ මුදල් සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 02/2026 දරන චක්‍රලේඛයේ කොන්දේසිවලට අනුකූලව කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

| අංක | තනතුර | වැටුප් කේතය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | B | 01 |
| 2. | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (මූල්‍ය) | D | 01 |
| 3. | ව්‍යාපෘති ලේකම් | F | 01 |

| වැටුප් කේතය හා තනතුරු නාම | අවශ්‍ය මූලික සුදුසුකම් |
|---|---|
| **B**<br>නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | පහත අනු අංක 01, 02 හෝ 03 අතුරින් එක් සුදුසුකමක්.<br>01. අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීමය සුදුසුකමක්<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 11ක සේවා පළපුරුද්දක් ලබා තිබීම, ඉන් වසර 5ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br><br>02. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීමය ආයතනයකින් ලබාගත් සාමාජිකත්වයක්.<br>සමඟ<br>අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ වසර 9ක පළපුරුද්දක් ලබා තිබීම, ඉන් වසර 4ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br><br>03. රජයේ දීපව්‍යාප්ත සේවාවක I පන්තියේ නිලධාරියකු වීම / අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් ලබා තිබීම<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් / පිළිගත් වෘත්තීයමය ආයතනයක ආශ්‍රිත සමාජිකත්වය හෝ සමාන වෘත්තීයමය ආයතනයක වෘත්තීයමය සුදුසුකමක් ලබා තිබීම. |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| | |
|---|---|
| | සමග<br>I පන්තියේ තනතුරක අවම වශයෙන් වර්ෂ 4ක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් ලබා තිබීම. |
| **D**<br>සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (මූල්‍ය) | පහත අනු අංක 1, 2 හෝ 3 අතරින් එක් සුදුසුකමක්<br>01. අදාළ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් උපාධියකට සමාන ලෙස පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම<br>සහ,<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) Licentiate II / Intermediate Examination / Certificate II in Accounting and Business / Business Level Examination / Corporate Level Examination හෝ ඊට ඉහළ විභාගයක් හෝ, පිළිගත් වෘත්තීය ආයතනයක් මඟින් පිරිනමනු ලබන අදාළ ක්ෂේත්‍රයට අදාළ සමාන වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම<br>සහ<br>එම සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07ක පළපුරුද්දක් ලබා තිබීම.<br><br>02. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් මඟින් පිරිනමනු ලබන Associate Membership හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br><br>03. රජයේ දීපව්‍යාප්ත සේවාවක II/III හෝ ඊට ඉහළ පන්තියේ නිලධාරියෙකු හෝ ක්ෂේත්‍රයට අදාල සමාන මට්ටමේ නිලධාරියෙකු වීම<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ II/III පන්තියේ තනතුරක හෝ ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 07ක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| **F**<br>ව්‍යාපෘති ලේකම් | පහත අනු අංක 01 හෝ 02 අතුරින් එක් සුදුසුකමක්.<br>01. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයක් (06) සඳහා සම්මාන සාමාර්ථ (Credit Pass) හතරක් (04) ලබා තිබීම<br>සහ<br>අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය පොදු පරීක්ෂණ පත්‍රය හැර විෂයයන් තුනක් (03) සමත් වී තිබීම<br>සහ<br>පිළිගත් ආයතනයක් මඟින් පවත්වනු ලබන ලේකම් කාර්ය පිළිබඳ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම හෝ Chartered Secretary වෘත්තීය සුදුසුකම ලබා ගැනීම සඳහා පැවැත්වෙන විභාග සඳහා අධ්‍යයනය කරමින් සිටීම<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br><br>02. Chartered Secretary වෘත්තීය සුදුසුකම ලබා තිබීම සහ, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04ක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

<u>වැටුප් පරාසය</u>

B – 370,000 – 390,000
D – 260,000 - 280,000
F – 160,000 – 175,000

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**විශේෂ කොන්දේසි**

ඉහත **B** කාණ්ඩයේ තනතුර සඳහා පහත විශේෂ සුදුසුකම් තිබීම අමතර සුදුසුකම් ලෙස සලකනු ලැබේ

1. ජාත්‍යන්තර ක්‍රමවේද යටතේ සිදුකර ඇති ප්‍රසම්පාදන පිළිබඳ ඇති පළපුරුද්ද
2. ජාත්‍යන්තර කොන්ත්‍රාත් කොන්දේසි (FIDIC) සහිතව සිදු කර ඇති ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමණාකරණය පිළිබඳ ඇති සේවා පළපුරුද්ද
3. විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන පිළිබඳව ඇති සේවා පළපුරුද්ද
4. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා අත්පොත (2024) පිළිබඳව වන දැනුම හා එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳව ඇති සේවා පළපුරුද්ද
5. උපදේශක සේවාවන් සඳහා වන ප්‍රසම්පාදනයන් පිළිබඳව ඇති සේවා පළපුරුද්ද

**පොදු කොන්දේසි**

1. ඉහත දක්වා ඇති පුරප්පාඩු තනතුරු සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 64ට අඩුවිය යුතුය.
2. සියලුම බඳවා ගනු ලබන්නන් අදාළ රාජ්‍ය සංවිධාන සහ වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කරමින් සිය රාජකාරී ඉටුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.
3. විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.
4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, රජයේ රෙගුලාසි පිළිබඳ පළපුරුදු බව සහ පරිගණක සාක්ෂරතාවය ඉහත තනතුරු සඳහා අත්‍යාවශ්‍ය පූර්ව සුදුසුකම් වේ.
5. රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් තෝරා ගනු ලැබුවහොත් අපේක්ෂකයා නිදහස් කළ හැකිද යන්න ඍජුව සඳහන් කරමින් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.
6. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2026 අනුව දීමනා සමග වැටුප් ගෙවනු ලැබේ. සේවකයා මාසික වැටුපෙන් 8%ක්, සේවක අර්ථ සාධක අරමුදලට දායක වන අතර සේවායෝජකයා 12%ක් සේවක අර්ථසාධක අරමුදලට සහ 3%ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වේ.

**අයදුම්පත්**

7. සුදුසුකම් ලත් අයදුම්කරුවන්, අදාළ තනතුරු සඳහා ඔවුන්ගේ යෝග්‍යතාව / සුදුසුකම් පෙන්වා දෙන ආවරණ ලිපියක් සමග, ඥාතීත්වයක් නොමැති නිර්දේශකයින් දෙදෙනකුගේ නම් සහ සම්බන්ධතා තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද ජීවදත්ත සටහනක් සහ අදාල අධ්‍යාපනික, වෘත්තීය සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් එවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. එසේ නොමැති නම්, අදාළ අයදුම්පත් තෝරාගැනීම සඳහා සලකා බලනු නොලැබේ.
8. අයදුම්කරුවන් සෑම තනතුරක් සඳහාම වෙන වෙනම අයදුම්පත් 2026 ඔක්තෝබර් 22 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. කරුණාකර අයදුම්පත් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කරන්න.

**තැපැල් ලිපිනය:- ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය, කොටා පාර, කොළඹ 08.**

9. ඉහළම සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර කුසලතා මත තෝරා ගැනීම සිදු කෙරේ.

ලේකම්.
ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
07 වන මහල, සෙත්සිරිපාය II අදියර
බත්තරමුල්ල.
2026 ඔක්තෝබර් 08